සැ. යු.- 2011.06.10 වැනි දින පළ වූ අංක 1,710 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,711 - 2011 ජූනි මස 17 වැනි සිකුරාදා - 2011.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
| --- | --- |
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 278 |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූනි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූනි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

277- B 80233—2,200 (2011/06)
D 1 -

# පිස්කල් වෙන්දේසියේ විකිණීම්

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්
ලංකා බැංකු මර්චන්ට් කුළුණ,
11 වන මහල,
අංක 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

නඩු අංකය : 17724/එම්. බී.
පිස්කල් අංක : 62/2011

........................................ *පැමිණිලිකරු.*

*එදිරිව*

01. ට්‍රැවල් නෙට්වර්ක් (පුද්.) සමාගම
අංක 81 1/1, මහා විද්‍යාල මාවත,
කොළඹ 13.

02. අරුණ එදිරිසිංහ
අංක 150/3, බටහේන පාර,
සූරියගම, කඩවත

............................................*විත්තිකරුවන්.*

ඉහත නම් සඳහන් විත්තිකරුවන් වෙතයි,

කොළඹ දිසා අධිකරණ නඩු අංක 17724/එම්. බී දරන නඩුවේ වර්ෂ 2008ක් වූ ජුනි මස 23 වැනි දින ඇතුළත් කර ඇති තීන්දු ප්‍රකාශය අනුව,

ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගෙන් පැමිණිකරුට අයවිය යුතු රුපියල් නවලක්ෂ හැටපන් දහස් තුන්සිය හතලිස් තුනයි ශත තිස්හය (රු. 9,65,343.36) ක මුදලක් සහ 2003.11.19 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරනු ලබන තෙක් මසකට 4% බැගින් පොළියද සමඟ මුළු මුදල ද, නඩු ගාස්තු ද, අයකර ගැනීම සඳහා අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති අතර, එසේ එකී මුදල් ගෙවීමට විත්තිකරුවන් අපොහොසත් වුවහොත්, එකී මුදල් අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ විස්තර වන නිශ්චල දේපල බැඳී තිබෙන බවටත්, එම දේපල වෙන්දේසි කර, එම මුදල් අයකර දීම සඳහා කොළඹ දිසා අධිකරණයේ ඉහත දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රය ප්‍රකාරව එකී නිශ්චල දේපල වර්ෂ 2011 ක්වූ ජූලි මස 15 වැනි දින ප. ව. 2.00ට එකී දේපල පිහිටි කඩවත, සූරියගම, බටහේන පාරේ, අංක 150/3 දරන ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධි වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් 25% මුදලක් ද, පිස්කල් ගාස්තු, රජයට අයවිය යුතු ෂ්‍රවුන්ඩේජ් ගාස්තු, තක්සේරු ගාස්තු වෙන්දේසිය ගැසට් පත්‍රයේ සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද, එම අවස්ථාවේ දී ම මුදලින් මා වෙත (රෙජිස්ට්‍රාර්/දිසා අධිකරණය/ගම්පහ) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ඉතිරි 75%ක මුදල දින තිහක් (30) ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

*උපලේඛනය*

01. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ අධිකාරි පත්තුවේ සූරියපාලුව ගමේ පිහිටි, ''තුන්හවුල් ගෝනගහ කුරුඳුවත්ත'' සහ ''දෙල්ගහවත්ත'' නැමති ඉඩම්වලට වර්ෂ 1986ක් වූ ජූලි මස 30 වැනි දින ඒ. ඊ. පී. ගුණසේන මානක තැන විසින් මැන සාදන ලද අංක 151 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක බී 2ට මායිම් : උතුරට : දාවිත් ගුරුන්නාන්සේට අයිති දෙල්ගහවත්ත ඉඩමද, නැගෙනහිරට : එච්. ඩී. සියදෝරිස්ට අයිති දෙල්ගහවත්ත ඉඩම ද, දකුණට : කැබලි අංක බී 3 සහ බී 4 ද, බටහිරට : කැබලි අංක බී 1 ද යන මායිම් තුළ වූ පර්චස් එකොළහයි දශම පහක (අ. 0, රූ. 0, පර්චස් 11.5) විශාලත්වයෙන් යුත් ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී250/203 සහ සී612/190හි ලියාපදිංචි වී ඇත.

පාරක් සඳහා වෙන් කරන ලද පහත සඳහන් ඉඩම් කැබලි ද සමඟ වේ.

02. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ අධිකාරි පත්තුවේ සූරියපාලුව ගමේ පිහිටි "තුන්හවුල් ගෝනගහ කුරුඳුවත්ත" සහ "දෙල්ගහවත්ත" නැමති ඉඩම්වලට වර්ෂ 1986ක් වූ ජූලි මස 30 වැනි දින ඒ. ඊ. පී. ගුණසේන මානක තැන විසින් මැන සාදන ලද අංක 151 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක බී 1ට මායිම්, උතුරට : දාවිත් ගුරුන්නාන්සේට අයිති දෙල්ගහවත්ත ඉඩම සහ කැබලි අංක ඒ 1 සහ බී 2 ද, නැගෙනහිරට : කැබලි අංක බී2, බී3, බී4, බී5 සහ බී6 ද, දකුණට : කැබලි අංක බී7 ද, බටහිරට : කැබලි අංක ඒ2 සහ ජේ. ඇලිස් පෙරේරා සහ තවත් අයට අයත් තුන්හවුල ගෝනගහ කුරුඳුවත්ත නමැති ඉඩම යන මායිම් තුළ වූ පර්චස් නමයයි දශම හතරක (අ. 0, රූ. 0, පර්. 9.4) විශාලත්වයෙන් යුත් ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී235/319 සහ සී 614/182හි ලියාපදිංචි වී ඇත.

03. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ අධිකාරි පත්තුවේ සූරියපාලුව ගමේ පිහිටි "තුන්හවුල් ගෝනගහ කුරුඳුවත්ත" සහ "දෙල්ගහවත්ත" නැමති ඉඩම්වලට වර්ෂ 1986ක් වූ ජූලි මස 30 වැනි දින ඒ. ඊ. පී. ගුණසේන මානක තැන විසින් මැන සාදන ලද අංක 151 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක ඒ 1ට මායිම්, උතුරට : වී එෆ්. ජේ. පෙරේරා මානක තැනගේ පිඹුරු අංක 632හි කැබලි අංක සී ද, නැගෙනහිරට : කැබලි අංක බී1 ද, දකුණට : කැබලි අංක ඒ2 ද, බටහිරට : පාරද යන මායිම් තුළ වූ පර්චස් හයයි දශම හතරක (අ. 0, රූ. 0, පර්. 6.4) විශාලත්වයෙන් යුත් ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී234/257 සහ සී614/183හි ලියාපදිංචි වී ඇත.

04. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ අධිකාරි පත්තුවේ සූරියපාලුව ගමේ පිහිටි "තුන්හවුල් ගෝනගහ කුරුඳුවත්ත" සහ "දෙල්ගහවත්ත" නැමති ඉඩම්වලට වර්ෂ 1986ක් වූ ජූලි මස 30 වැනි දින ඒ. ඊ. පී. ගුණසේන මානක තැන විසින් මැන සාදන ලද අංක 151 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක සී ට මායිම්, උතුරට : ජේ. ඒ. ආරොන් අප්පුහාමිට අයත් තුන්හවුල් ගෝනගහ කුරුඳුවත්ත සහ දාවිත් ගුරුන්නාන්සේට අයත් දෙල්ගහවත්ත ද, නැගෙනහිරට : පිඹුරු අංක 632 හි කැබලි අංක බී ද, දකුණට : ඉහත කී පිඹුරු අංක 632හි කැබලි අංක ඒ ද, බටහිරට : පටු පාරද යන මායිම් තුළ වූ පර්චස් තුනයි දශම දෙකක (අ. 0, රූ. 0, පර්. 3.2) විශාලත්වයෙන් යුත් ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 230/272 සහ සී 614/184හි ලියාපදිංචි වී ඇත.

ජී. ඒ. කේ. ගුරුසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2011ක් වූ ජුනි මස 01 වැනි දින,
ගම්පහ දිසා අධිකරණයේ දී ය.

06-300

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.